SLGURU.LK

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25A | S | I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

Second Term Test - Grade 13 - 2020

විභාග අංකය ..... ඉන්දියා ඉතිහාසය I කාලය පැය තුනයි

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

I කොටස

- **අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් 05 බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක්වා සමඟ නොගැලපේ. එම නොගැළපෙන නාමය තෝරා එයට අදාළ අංකය දී ඇති හිස්තැනෙහි ලියන්න.**

01.	1.	හින්දුකුෂ්	2. සුලෙයිමාන්	3.	සත්පුර	4.	බෝලාන්	5.	වින්ධ්‍යා	(.....)
02.	1.	ශුංග	2. ගුප්ත	3.	ඉන්දු ග්‍රීක	4.	ශක	5.	කුෂාණ	(.....)
03.	1.	අශ්වඝෝෂ	2. නාගර්ජුන	3.	වසුබන්ධු	4.	කාලිදාස	5.	පාර්ශව	(.....)
04.	1.	භාජා	2. බෙද්සා	3.	කාර්ලේ	4.	නාලන්දා	5.	කන්හේරි	(.....)
05.	1.	අමරසිංහ	2. ශංකු	3.	ධන්වන්තරී	4.	වාල්මිකී	5.	වරහමිහිර	(.....)
06.	1.	මේඝදූත	2. ඍතුසංහාරය	3.	මෘච්ඡකටිකා	4.	ශාකුන්තලය	5.	රඝු වංශය	(.....)
07.	1.	නාලන්දා	2. වික්‍රමශිලා	3.	ඕදන්තපුරි	4.	උජ්ජෙයිනි	5.	ජගන්දලා	(.....)
08.	1.	දන්ති දුර්ග	2. ධ්‍රැව	3.	ගෝවින්ද	4.	ක්‍රිෂ්ණ	5.	හර්ෂවර්ධන	(.....)
09.	1.	මහානදී	2. ක්‍රිෂ්ණ	3.	තුංගභද්‍ර	4.	සින්දු	5.	කාවේරි	(.....)
10.	1.	නිගණ්ඨනාථපුත්‍ර		2.	අජිත කේශකම්බල			3.	පූර්ණ කස්සප	
	4.	ගෞතමීපුත්‍ර		5.	මක්ඛලි ගෝසාල					(.....)

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්නවල පද යුගල 05 බැගින් දී ඇත. ඒවා අතුරින් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය තෝරා එයට හිමි අංකය අදාළ හිස්තැනෙහි ලියන්න.**

11.	1.	මෞර්ය	- බෘහද්රථ
	2.	ශුංග	- පුෂ්‍යමිත්‍ර
	3.	ඉන්දු ග්‍රීක	- මිනැන්ඩර් (මිලින්ද)
	4.	කුෂාණ	- කණිෂ්ක.
	5.	ගුප්ත	- හර්ෂවර්ධන. (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

12. 1. කාලිදාස - මාලවිකාග්නිමිත්‍ර
    2. විශාකදත්ත - මුද්‍රාරාක්ෂය
    3. අමරසිංහ - අමරකෝෂය
    4. ශූද්‍රක - රඝුවංශය
    5. ආර්යභට - සූර්ය සිද්ධාන්ත (.....)

13. 1. අවන්ති - චණ්ඩ පජ්ජෝත.
    2. කෝසල - ප්‍රසේනජිත්
    3. මගධ - බිම්බිසාර
    4. කුරු - බ්‍රහ්මදත්ත.
    5. වාත්ස - උදයන (.....)

14. 1. නිෂ්ක - මුදල් ඒකකයක්
    2. පුර - ඉන්දු ශිෂ්ටාචාරයේ නගර හා බලකොටු
    3. වත්ස - කෞසම්බියේ අගනුවර
    4. දස රාඥ - සමුද්‍රගුප්ත රජුගේ යුධ ප්‍රයාණ
    5. මණ්ඩලම් - චෝළ පරිපාලන ඒකකයකි. (.....)

15. 1. බාරවේල - හතිගුම්පා
    2. රුද්‍රදාමන් - ජුනාගාද්
    3. කණිෂ්ක - හෝගාස්කොයි
    4. සමුද්‍රගුප්ත - අලහබාද්
    5. II පුලකේශීන් - අයිහෝල් (.....)

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා වූ ප්‍රශ්න සඳහා නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් X සහ Y තීරුවේ දී ඇත. එහෙත් Y තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන/දින වකවානු X තීරුව සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දී ඇත්තේ අනු පිළිවෙළට නොවේ. Y තීරුව X තීරුව සමඟ නිවැරදිව ගලපා නිවැරදි වරණය තෝරා හිස්තැනෙහි ලියන්න.**

	X		Y
16. 1.	ඉන්ද්‍රප්‍රස්ථ	A	ගංගා - යමුනා දෙගම්මැදියේ
2.	කෞෂම්බි	B	යමුනා නිම්නයේ
3.	හරප්පා	C	සත්ලෙජ් හා රාවි නදීන් අතර
4.	නාසික්	D	ගෝදාවරී නිම්නයේ
5.	භාරුකච්ඡ	E	නර්මදා මුවදොර

1. ABCDE 2. ACBED 3. ADBCE 4. AECBD 5. ADECB (.....)

	X		Y
17. 1.	බින්දුසාර රජු	A	අමිත්‍රඝාත
2.	අශෝක රජු	B	වාතාපිකොණ්ඩ
3.	I චන්ද්‍රගුප්ත	C	සකල උත්තරාපථනාථ
4.	හර්ෂවර්ධන රජු	D	ප්‍රියදර්ශී
5.	නරසිංහවර්මන් රජු	E	මහාරාජාධිරාජ

1. ABCDE 2. BAECD 3. BCDEB 4. ADECB 5. CABED (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

	X		Y
18.	1. දිල්ලිතෝප්‍රා ටැම් ලිපිය	A	මාගේ ධර්මය යනු කුමක්ද පැනයට පිළිතුරු
	2. හවන ගිරි ලිපිය	B	සියලු මනුෂ්‍යයෝ මාගේ දරුවෝය
	3. ධෞලි ගිරි ලිපිය	C	මුළු ලොවට වැඩ සැලසීම.
	4. 13 වන ගිරි ලිපිය	D	සියලු ආගම්වලට ගරු කිරීම.
	5. 12 වන ගිරි ලිපිය	E	දිග් විජය ප්‍රතිපත්තිය අතහැර ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කිරීම.

1. ABCDE 2. BACED 3. ACBED 4. CABDE 5. DABCE (.....)

	X		Y
19.	1. I වන චන්ද්‍රගුප්ත	A	ක්‍රි.පූ. 269
	2. අශෝක	B	ක්‍රි.ව. 78
	3. සමුද්‍රගුප්ත	C	ක්‍රි.ව. 320
	4. කණිෂ්ක	D	ක්‍රි.ව. 335
	5. පුෂ්‍ය මිත්‍ර	E	ක්‍රි.පූ. 185

1. ABCAD 2. CADBE 3. BCADE 4. CABDE 5. DBACE (.....)

	X		Y
20.	1. ක්‍රිෂ්ණ	A	මාල්වා උස්බිම්
	2. සින්දු	B	හිමාලයා
	3. චම්බාල්	C	ඩෙකැන් සානුව
	4. බ්‍රහ්මපුත්‍ර	D	බටහිර සාට්ස්
	5. මහානදී	E	ටිබෙට්

1. ADCBE 2. BEDCA 3. CBAEA 4. DBAEC 5. ECBAD (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ යොදන්න.**

21. කාලිංගය මගධයට ඈඳගත් රජතුමා කවුරුන්ද?

1. බිංදුසාර 2. කුණාල 3. I චන්ද්‍රගුප්ත 4. අශෝක 5. බෘහද්රථ (.....)

22. කණිෂ්ක රජුගේ රාජධානියට අයත් වූ වැදගත් සංස්කෘතික මධ්‍යස්ථානය කුමක්ද?

1. පාඨලී පුත්‍ර 2. පුරුෂපුරය 3. සාගල 4. දිල්ලිය 5. මථුරා (.....)

23. ඍග් වෛදික යුගයේ ''දවසට අධිපති'' දෙවියන් කවුරුන්ද?

1. ඉන්ද්‍ර 2. වරුණ 3. අග්නි 4. සූර්ය 5. ඌෂා (.....)

24. අශෝක රාජ්‍ය සමයේ නිර්මාණයවූ අපූර්වතම කලා නිර්මාණය කුමක්ද?

1. සාංචි ස්ථූපය 2. අශෝක ස්ථම්භ 3. සාරානාත් ස්තම්භය
4. අලහබාද් සෙල්ලිපිය 5. අක්ෂර කලාව (.....)

25. 'මිලින්ද පඤ්හ' ග්‍රන්ථයේ කර්තෘ වරයා කවරෙක්ද?

1. මිලින්ද 2. වරහමිහිර 3. වසුබන්ධු 4. නාගසේන 5. නාගර්ජුන (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

- **අංක 26 සිට 30 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

26. විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර,
    1. ඉන්දීය ඉතිහාසය පිළිබඳ වැදගත්ම සටහන් ලියා ඇත්තේ හියුංසාං හිමියන් විසිනි.
    2. සමකාලීන ඉන්දියාව පිළිබඳව වැදගත් තොරතුරු රැසක් මෙගස්තීනීස්ගේ ඉන්ඩිකා කෘතියේ අන්තර්ගත වේ.
    3. ටොලමි විසින් ලියන ලද භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය ග්‍රීක මූලාශ්‍රය.
    4. ඉන්දියාවේ භූගෝලීය ලක්ෂණ, සමාජය, පාලනය ආදී වැදගත් තොරතුරු රැසක් මේවායෙහි අන්තර්ගත වේ.
    5. භ්‍රමණ වෘත්තාන්තය හියුංසාං හිමියන් විසින් රචනා කරන ලදී. (.....)

27. කාලිදාස
    1. ශ්‍රී ලංකාවේ කුමාරදාස රජු කාලිදාසයන්ගේ සමකාලීනයකු ලෙස සැලකේ.
    2. කාලිදාස සන්දේශ කාව්‍ය සම්ප්‍රදායේ ආරම්භකයා ලෙස සැලකේ.
    3. මිලින්ද රජු කාලිදාසගේ ශිෂ්‍යයෙකි.
    4. රඝුවංශය හා කුමාරසම්භවය මොහුගේ ශ්‍රේෂ්ඨ කාව්‍ය ග්‍රන්ථ දෙකකි.
    5. කාලිදාස යනු දෙවන චන්ද්‍රගුප්ත රාජ්‍ය සභාවේ සිටි එක් පඬිවරයෙකි. (.....)

28. මෞර්‍යයන් යටතේ පාටලීපුත්‍ර නගරයේ පරිපාලනයයි.
    1. නගරය ආරක්ෂාවූයේ දැවයෙන් කළ පවුරකින් හා දිය අගලකිනි.
    2. වෙළඳපොලේ විකුණන ලද භාණ්ඩවලින් බද්දක් අය කරන ලදී.
    3. නගරය පාලනය කරන ලද්දේ 30 දෙනෙකුගෙන් යුත් කමිටුවක් මගිනි.
    4. කමිටුව අනු කමිටු 6කට බෙදා තිබුණි.
    5. කමිටුවේ ප්‍රධානියා වූයේ භාණ්ඩගාරිකය. (.....)

29. හර්ෂවර්ධන රජතුමා,
    1. මොහු මහායාන බෞද්ධාගම ඇදහූවකු විය.
    2. තම සහෝදරයාගේ මරණයෙන් පසු හර්ෂවර්ධන ථානේශ්වරයේ රජවිය.
    3. පුරාණ ඉන්දියාවේ අන්තිම අධිරාජ්‍ය බිහිකළ රජෙකු ලෙස ඉතිහාසඥයන් විසින් හර්ෂවර්ධන හඳුන්වනු ලබයි.
    4. හර්ෂවර්ධන විසින් අශෝක මරා කාලිංගය යටත් කරගන්නා ලදී.
    5. හර්ෂවර්ධන රජුගේ දකුණේ යුධ ව්‍යාපාරය චාලුක්‍ය වංශික දෙවන පුලකේශීන් විසින් වාර්තා කරන ලදී. (.....)

30. පාල රාජ්‍ය සමයේ සංස්කෘතික වැදගත්කම.
    1. ඉන්දියාවේ අවසන් බෞද්ධ අධිරාජ්‍ය වේ.
    2. පාල රජවරුන් බුදු දහමට ප්‍රබල අනුග්‍රහයක් දක්වන ලදී.
    3. මෙම පාලකයන් විසින් සංස්කෘතික සේවාවන් රැසක් සිදුකරනලදී.
    4. ධර්මපාල රජු නාලන්දා විහාරයට ගම්වර පූජා කිරීම. (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

- **ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති A,B, C, D යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදිව ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

  A සහ B පමණක් නිවැරදිනම් 1 ද,

  Bසහ C පමණක් නිවැරදි නම් 2 ද,

  C සහ D පමණක් නිවැරදි නම් 3 ද,

  A සහ C පමණක් නිවැරදි නම් 4 ද,

  ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි ගණනක් නිවැරදි නම් 5 ද වරහන තුළ ලියන්න.

උපදෙස් සම්පිණ්ඩනය				
1	2	3	4	5
A සහ B පමණක් නිවැරදිය.	B සහ C පමණක් නිවැරදිය.	C සහ D පමණක් නිවැරදිය.	A හා C පමණක් නිවැරදිය.	ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැදිය.

31. ගුප්ත සංස්කෘතිය,

A ගුප්ත යුගයේදී බොහෝ සාහිත්‍ය කෘති සංස්කෘත භාෂාවෙන් ලියැවුණි.

B මෙම යුගයේදී බ්‍රාහ්මණ ආගම හින්දු ආගම බවට පත්විය.

C මෙම යුගයේදී වඩාත් වන්දනාවට ලක්වූයේ ඉන්ද්‍ර දෙවියන්ය.

D අවුකන පිළිමය මෙම යුගයේ උසස් මූර්තියක් ලෙස සැලකේ. (.....)

32. මෞර්ය ප්‍රාදේශීය පාලනය

A අධිරාජ්‍ය පාලන ඒකකවලට බෙදා නොතිබුණි.

B මෞර්යය අධිරාජ්‍යයේ විශිෂ්ඨතම පාලකයා කණිෂ්ක රජුය.

C වරෙක උජ්ජෙයිනීය අශෝක රජු විසින් පාලනය කරන ලදී.

D අගනුවරට අයත් පාලන ඒකකය අගරජුගේ පාලනය යටතේ පැවතිණි. (.....)

33. සාතවාහනයෝ

A සාතාවාහන රාජ්‍ය පිහිටුවන ලද්දේ නැගෙනහිර ඩෙකැනයේය.

B සාතාවාහන රාජධානියේ ආරම්භක පාලකයා පළමුවන සාතකර්ණීය.

C පුරාණ ග්‍රන්ථවල සාතවාහනයෝ ආන්ද්‍රයෙක් ලෙසහඳුන්වා ඇත.

D සාතවාහනයෝ ඩෙකැනයේ බලය ලබාගන්නේ එහිසිටි කාණ්ඩවයන් නෙරපා දැමීමෙන් අනතුරුවය. (.....)

34. සමුද්‍රගුප්ත රජු,

A අශෝක ස්තම්භයක ලියා ඇති අලහබාද් ප්‍රශස්තිය සමුද්‍රගුප්ත පිළිබඳ තොරතුරු සපයන වැදගත් මූලාශ්‍රයකි.

B ඔහුගේ පළමු යුධ ව්‍යාපාරය නාග රජවරුන්ට විරුද්ධව දියත් කෙරිණි.

C ඊළඟ වැදගත් යුධ ව්‍යාපාරය දකුණු ඉන්දියානු රජවරුන්ට විරුද්ධවය.

D සිය යුධ ව්‍යාපාර අවසන් කිරීමෙන් අනතුරුව ඔහු අශ්ව මේධ යාගයක් පැවැත්වීමය. (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

35. හූණ ආක්‍රමණ,

A උතුරු ඉන්දියාවේ ප්‍රධානතම පාලකයෝ බවට පත් වූහ.

B මොවුන් උතුරු ඉන්දියාවේ එක්සත් භාවය විනාශ කළහ.

C කාශ්මීරයේ බෞද්ධ ආරාමසහ සිද්ධස්ථාන විනාශ කර දැමූහ

D මෙකල හින්දු දේව වන්දනය ජනප්‍රිය අංශයක් බවට පත් වී තිබිණි. (.....)

- **අංක 36 සිට 40 දක්වා තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 හා 5 වන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

පළමුවැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
1. නිවැරදිය	වැරදිය
2. නිවැරදිය	නිවැරදිය
3. වැරදිය	වැරදිය
4. වැරදිය	නිවැරදිය
5. නිවැරදිය	නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි.

පළමු වැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
36. මෞර්ය බලය බිඳවැටීමෙන් පසු බ්‍රැක්ට්‍රියානු ග්‍රීකයන් අනාරක්ෂිත වූ වයඹදිග ඉන්දියාව ආක්‍රමණය කරන ලදී.	ඉන්දු ග්‍රීකයන්ගේ ශ්‍රේෂ්ඨතම පාලකයා වන්නේ මිනැන්ඩර් හෙවත් මිලින්ද රජුය. (.....)
37. කුෂාකයන් විදේශීය ප්‍රභවය ලැබූ රාජවංශයක් වූවත් ඉන්දීය සංස්කෘතියට විශාල අනුග්‍රහයක් දැක්වීම.	කුෂාණ පාලකයන් විසින් තුන්වන ධර්ම සංඝායනාව පැවැත්වීම. (.....)
38. සමුද්‍ර ගුප්ත රජුගේ බල ව්‍යාප්තිය අදියර 6ක් යටතේ සිදුවිය.	මොහු පිළිබඳව හැදෑරීමටඇති ප්‍රධානතම ලේඛනය හරිසේනගේ අලහබාද් ප්‍රශස්තියයි. (.....)
39. මහා කවි කාලිදාස ජෛන භක්තිකයෙකු වීම.	ඔහු ස්කන්ධදේව උත්පත්තිය අළලා රඝුවංශය නම් මහා කාව්‍ය ග්‍රන්ථයක් රචනා කිරීම. (.....)
40. ස්කන්ධ ගුප්ත රජුගෙන් පසු ගුප්ත අධිරාජ්‍යයේ පරිහානිය උදාවිය.	දුර්වල පාලකයින් බලයට පත්වීම, අභ්‍යන්තර අරගල, ප්‍රාදේශීය පාලකයින් බලයට පත්වීම, ආර්ථික පරිහානිය, විදේශ ආක්‍රමණ මෙම යුගයේදී ඇතිවිය. (.....)

SLGURU.LK

For Educational Purpose Only

“The important thing is not to stop questioning.” — Albert Einstein

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

25A | S | II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

Second Term Test - Grade 13 - 2020

විභාග අංකය .....

ඉන්දියා ඉතිහාසය II

උපදෙස්

- පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

A කොටස

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සියළුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

(i) හින්දු කුෂ් (ii) භාරුකච්ච (iii) හරප්පා (iv) කැලිකට්
(v) ඉන්ද්‍රප්‍රශ්ථ (vi) තක්ෂිලා (vii) තප්ති ගග (viii) ජුනාගාද්
(ix) සාංචි (x) යමුනා (xi) මථුරා (xii) අජන්තා

(නිවැරදිව ලකුණු කොට නම් කිරීමට ලකුණු 1 බැගිනි)

B කොටස

02. පැරණි ඉන්දීය ඉතිහාසය හැඩ ගැසීම කෙරෙහි අභ්‍යන්තර භූගෝලීය සාධකවල බලපෑම,
(i) ගංගා පද්ධතිය (ii) දුර්ග මාර්ග (iii) කඳුවැටි
(iv) කාන්තාව හා සානු යන අංශ යටතේ පැහැදිලි කරන්න. (ල. 16)

03. 'පශ්චාත් වෛදික යුගය ඉන්දීය ඉතිහාසයේ පරිවර්තන යුගයකි.'
(i) ආර්යයන් ඉන්දියාවට පැමිණියේ යැයිසැලකෙන ප්‍රදේශය කුමක්ද? (ල. 1)
(ii) වෛදික යුගයේ ජනාවාස ප්‍රධාන වශයෙන් පිහිටා තිබුණු ගංගාව සහ පශ්චාත් වෛදික යුගයේදී ජනාවාස ප්‍රධාන වශයෙන් පිහිටා තිබුණු ගංගා දෙක පිළිවෙළින් නම් කරන්න. (ල. 2)
(iii) පශ්චාත් වෛදික යුගය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට උපයෝගී කරගත හැකි මූලාශ්‍ර 2ක් නම් කරන්න. (ල. 2)
(iv) පශ්චාත් වෛදික යුගයේ සමාජයෙහි ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ල. 4)
(v) ඍග් වෛදික යුගයේ ආගමික විශ්වාස හා චාරිත්‍ර තත්වයක් පශ්චාත් වෛදික යුගයේදී වෙනස් වී ඇති ආකාරය පරීක්ෂා කරන්න. (ල. 7)

04. ''ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය යනු පැරණිතම ඉන්දියානු සභ්‍යත්වයයි''
(i) මෙම ශිෂ්ටාචාරයට අයත් ප්‍රදේශවල කැණීම් කළ පුරෝගාමී විද්වතුන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 2)
(ii) ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයට අයත් ප්‍රධාන නගර 2ක්නම් කරන්න. (ල. 2)
(iii) ඉන්දු නිම්න වැසියන්ගේආගමික විශ්වාස පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)
(iv) මෙම ශිෂ්ටාචාරය නාගරික සභ්‍යත්වයක් ලෙස හඳුනා ගැනීමට උපකාරී වනසාධක පරීක්ෂා කරන්න. (ල. 8)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

05. පහත දැක්වෙන මාතෘකා දෙකක් අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව සටහන් ලියන්න.
(i) විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර (ii) සොළොස් මහා ජනපදවල ක්‍රියාත්මකවූ පාලනය ක්‍රම
(iii) මගධ අධිරාජ්‍ය (iv) භාරත මූලාශ්‍ර (එක් කොටසකට ලකුණු 8 බැගිනි)

C කොටස

06. ''කුෂාණ යුගයේ වැදගත්ම පාලකයා කණිෂ්ක රජුය.''
(i) කුෂාණ රජ පරපුරේ මුල්ම පාලකයා සහ ඔහුගෙන් පසු බලයට පත් පාලකයා පිළිවෙළින් නම් කරන්න. (ල. 2)
(ii) කුෂාණවරුන්ගේ මුල් නිජ බිම සහ ඔවුන්ගේ ගෝත්‍රය පිළිවෙළින් නම් කරන්න. (ල. 2)
(iii) කුෂාණ යුගයේ ආගමික හා සංස්කෘතික වැදගත්කම පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 4)
(iv) ඉහත ප්‍රකාශය සැලකිල්ලට ගනිමින් කණිෂ්ක රජුගේ දේශපාලන සංසිද්ධිය විස්තර කරන්න (ල. 8)

07. සමුද්‍රගුප්ත රජුගේ දේශපාලන කාර්ය සාඵල්‍ය අගයන්න. (ල. 16)

08. 'පශ්චාත් ගුප්ත යුගය උතුරු ඉන්දියාවේ කැපී පෙනෙන ලක්ෂණ පෙන්නුම් කරයි.''
(i) පශ්චාත් ගුප්ත යුගයේ බලවත් වූ ප්‍රාදේශීය රාජ්‍යයන් 02 ක් නම් කරන්න. (ල. 2)
(ii) හර්ෂවර්ධන රජු අයත් රාජවංශය සහ ඔහු පිළිබඳ තොරතුරු සඳහන් මූලාශ්‍රය පිළිවෙළින් නම් කරන්න. (ල. 2)
(iii) හර්ෂවර්ධන රාජ්‍ය සමයේආගමික හා සාහිත්‍ය කටයුතු පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.(ල. 4)
(iv) ඉහත ප්‍රකාශය සනාථ කරමින් හර්ෂවර්ධන රජුගේ දේශපාලන කාර්ය භාරය විස්තර කරන්න. (ල. 8)

09. පහත මාතෘකා 2ක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.
(i) ගුප්ත යුගයේ සංස්කෘතිය
(ii) යානවාහන සමයේ සංස්කෘතික කටයුතු
(iii) පාල රාජවංශයේ සංස්කෘතික කටයුතු
(iv) II චන්ද්‍රගුප්ත රජු (එක් කොටසකට ලකුණු 8 බැගිනි)

SLGURU.LK
For Educational Purpose Only

“The important thing is not to stop questioning.” — Albert Einstein

Visit SLGURU.LK to download papers and notes.


SLGURU.LK

දෙවන වාර පරීක්ෂණය 2020 - ඉන්දියා ඉතිහාසය.
පිළිතුරු 13 - ශ්‍රේණිය 1 කොටස

(01)	- 4	(11)	- 5	(21)	- 4	(31)	- 1
(02)	- 2	(12)	- 4	(22)	- 2	(32)	- 3
(03)	- 4	(13)	- 4	(23)	- 4	(33)	- 4
(04)	- 4	(14)	- 4	(24)	- 2	(34)	- 5
(05)	- 4	(15)	- 3	(25)	- 4	(35)	- 2
(06)	- 3	(16)	- 1	(26)	- 4	(36)	- 2
(07)	- 4	(17)	- 4	(27)	- 2	(37)	- 1
(08)	- 5	(18)	- 3	(28)	- 5	(38)	- 4
(09)	- 4	(19)	- 2	(29)	- 4	(39)	- 3
(10)	- 4	(20)	- 4	(30)	- 5	(40)	- 5

(ලකුණු 40)

11 පත්‍රය - පිළිතුරු



II පත්‍රය

01. සිතියම - සිතියම ලකුණු කර ඇති ආකාරයට අනුව ලකුණු ලබාදෙන්න. (ල. 12)

B කොටස

02. 1. ගංගා පද්ධතිය : සින්දු, නර්මදා, තප්ති, බ්‍රහ්මපුත්‍ර, යමුනා, ගංගා නම් ගඟ, මහානදිය, ගෝධාවරී, ක්‍රිෂ්ණ තුංගභද්‍ර, කාවේරි ආදී ගංගා.
2. දුර්ග මාර්ග : ඛයිබර්, බෝලාන්, මක්‍රාන්, හේරත්,ආදී දුර්ග මාර්ග.
3. කඳුවැටි : හිමාලයා, හින්දුකුෂ්, වින්ධ්‍යා, සත්පුර, අරවල්ලි, නැගෙනහිර සාට්ස්, බටහිර සාට්ස් ආදී කඳුවැටියන්.
4. කාන්තර හා සානු : ථාර් කාන්තාරය, ඩෙකැන් සානුව ආදිය පිළිබඳ විස්තර කරන්න. (ල. 16)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

03. (i) මධ්‍යම ආසියාවේ ස්ටෙප්ස් තෘණ භූමි ප්‍රදේශය. (ල. 1)

(ii) වෛදික යුගයේ - සින්දු ගග - පශ්චාත් වෛදික යුගයේ - ගංගා නම් ගග (ල. 2)

(iii) යජුර්, සාම, අතර්වන්, බ්‍රාහ්මණ, උපනිශද් (ල. 2)

(iv) පශ්චාත් වෛදික යුගයේ සමාජ ලක්ෂණ :

* ගෝත්‍රික සමාජය තවදුරටත් ස්ථාවර තත්වයට පත්වීම. * බ්‍රාහ්මණ බලය බෙහෙවින් වර්ධනය වීම.
* ක්ෂත්‍රියයන් රාජ්‍ය පාලනයත්, වෛශ්‍යයින් ගොවිතැන හා වෙළඳමක්. ශූද්‍රයන් ඉහළ කුලවල සේවා කිරීමත් සිදුවීම.
* සමාජය කුලවලට බෙදී තිබීම.
* බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ, සන්‍යාසි යන වර්ණාශ්‍රම ධර්ම මගින් සමාජය හැඩගැස්වීම.
* කාන්තාවන්ට තිබූ නිදහස වේගයෙන් අහිමි වී යෑම.
* ඒක භාර්‍යාමෙන්ම බහු භාර්යා සේවනයද දක්නට ලැබීම.
* ඇඳුම් පැළඳුම් සෘග් වෛදික යුගයේ පැවති තත්වයෙන් යම් යම් වෙනස්කම් සිදුවීම.
* විනෝදාංශ ලෙස ගායනය, වාදනය, නර්තනය, දූකෙළිය, රිය ධාවනය පැවතීම.
* ආහාර රටාව සෘග් වෛදික යුගයේ මෙන්ම පැවතීම. (ආදිය විස්තර කරන්න) (ල. 4)

(v) **<u>සෘග් වෛදික යුගය</u>**

* ස්වභාවික වස්තූන්ට, බලවේගයන්ට දේවත්වයක් ආරෝපණය කොට වන්දනා කිරීම.
* බහුදේවවාදී ආගමික රටාවක් ඉස්මතු වීම.
* මෙම දේව පිරිස් ප්‍රධාන කොටස් 3කට බෙදා තිබීහ. ඒවා ආකාශ, අනතරීක්ෂ, පෘථිවි. ලෙස බෙදා තිබීම.
* එක් එක් දෙවියා ස්වභාව ධර්මයේ විවිධ අංග නියෝජනය කිරීම.
  උදා : ඉන්ද්‍ර - ශක්තිය, වැස්ස, මේඝ, ගර්ජන ආදියට අධිපති.
  වරුණ - ජලයට, ශාක හා සත්ත්ව ජීවිතපවත්වාගෙන යාමට ආදී වශයෙන්.
* බොහෝ දෙවිවරුන්ට පූජා කරන ජනප්‍රිය පූජා ද්‍රාවනයක් වූ සෝමපානය සෝම දෙවියා ලෙස වන්දනයට පාත්‍ර වීම.
* වෛදික දෙවිවරුන් පිදීමට සෘග් ටෙව්දයේ විවිධ ස්තෝත්‍ර ගීතිකා 1028 කින් වැඩි ප්‍රමාණයක් යොදාගෙන තිබීම.
* යාඥය නම් වූ ආගමික කාර්ය ඉතා කුඩාවට ''ගෘහ යාග'' ලෙස මෙකල ආරම්භ වීම.
* දෙවියන් හා මිනිසුන් සම්බන්ධ කළ අතරමැද දෙවියා ලෙස අග්නි දෙවියා වැදගත් වීම.
* මෙම ආගමික සංකල්ප තව දුරටත් විකාශනය වීමෙන් පශ්චාද් වෛදික යුගයේ ආගමික තත්වය වර්ධනය වීම.

<u>පශ්චාත් වෛදික යුගය :</u>

* සෘග් වෛදික ආගමික සංකල්ප තව දුරටත් විකාශනය වී බහුදේවවාදය ඒක දේවවාදයක් බවට පත් වීම.
* සෘග් වෛදික පැරනි දෙවිවරුන් රාශියකගේ බලවත් බවනැති වී ඔවුන් නොවැදගත් තත්වයට පත්වීම.
* විෂ්ණු, ඊශ්වර, බ්‍රාහ්ම යන දෙවිවරුන් (ත්‍රි මූර්තිය) ජනප්‍රිය සංකල්පයක් බවට පත්වීම.
* සරල යාග සංකීර්ණ යාග බවට පත්වීම.
* සරල ගෘහ යාග මහා යාග වී සතුන් පමණක් නොව මිනිසුන් ද බිලිදීම තෙක් වර්ධනය වීම.
* බ්‍රාහ්මණයාගේ තත්වය ඉහළ යෑමනිසා ඔහු ''භූසුරු'' නමින් හැඳින්වීම.
* දෙවිවරුන්ගේ සේවකපිරිසක් ලෙස බ්‍රාහ්මණයන් ක්‍රියා කිරීම.
* ආරණ්‍යක හා උපනිශදිවැනි යුගයක් කරා එලඹීමත් සමග බ්‍රාහ්මණ සංකල්පයට එරෙහිව ශ්‍රමණ සම්ප්‍රදායක් ඉස්මතු වීම.
* පසු කලෙකදි බ්‍රාහ්මණ බලය පිරිහී ධ්‍යාන වඩන තවුසන්ට ප්‍රමුඛත්වය ලැබීම.
* ක්ෂත්‍රියයන් උපනිෂද් දර්ශනයේ පුරෝගාමීන් වීම.
* මේ පසුබිම මගින් පසුකාලීනව දාර්ශනික හා ආගමික මතවාද රාශියක් ඉස්මතුවීම.
* බුදුන් වහන්සේගේ දර්ශනයට පවා බලපෑමේ උපනිශද් දර්ශනයයි. ආදී විස්තර කරන්න. (ල. 7)

04. (i) දයාරාම් ශානි, මෝටිමර්වීලර්, වසන්ත් සින්ද්, ඒ ඝෝෂ්, එම්.එස්. වත්ස්, ආර්.ඩී. බැනර්ජි, ජෝන් මාෂල්, මැකේ. (ල. 2)

(ii) හරප්පා. මොහොන්ජොදාරො, රඹීගාර්හි. (ල. 2)

(iii) ජගන් මාතා වන්දනය, වෘක්ෂ වන්දනය, ජලවන්දනය ආදිය පිළිබඳ විස්තර කරන්න. (ල. 4)

(iv) නාගරික ලක්ෂණ : නිවාස පද්ධතිය ඇතුළු නගරය, හරප්පාවේ ධාන්‍යාගාරය, මොහොන්ජොදාරෝවේ ස්නානාගාරය, ආලෝක කුලුණු, රඹීගාර්හි විශාල ස්නානාගාරය, දියුණුව නාගරික සැලසුම් රඹීගාර්හිවලින හමුවීම ආදිය විස්තර කරන්න. (ල. 8)

05. (i) විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර

* ශ්‍රී ලංකාවේ මූලාශ්‍ර - දීප වංශය, මහා වංශය, සමන්තපාසාදිකා.
* ග්‍රීක මූලාශ්‍ර - මෙගස්තීනිස්, හෙරඩෝටස්, ස්ට්‍රාබෝ, ජස්ටින් ජෙරිප්ලස් ඔෆ් එරිත්‍රියන් වී යන ග්‍රන්ථ.
* රෝම මූලාශ්‍ර - ප්ලීනිගේ නැචුරාලිස හිස්ටෝරියා, ටොලමිගේ භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය.
* චීන මූලාශ්‍ර - පාහියං වාර්තා, හියුංසාං වාර්තා, ඉත්සිං වාර්තා.
* ටිබෙට් මූලාශ්‍ර - ඇල්බිරූනි, අල්මසුදි, ඉබන් කුර්දාද්, ඉබන් ඛහිරිහාන් තාරානාථයින්ගේ වාර්තා
* කැපී පෙනෙන විදේශීය මූලාශ්‍ර ලෙස මෙගස්තීනිස්ගේ ඉන්ඩිකා, හියුංසාං ගේ වාර්තා වැදගත් වීම ආදිය විස්තර කරන්න.

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

(ii) සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න.

(iii) මගධ - අධිරාජ්‍ය - ඉන්දියාවේ සොළොස් මහා ජනපද අතරින් මගධය අනෙක් ජනපද අභිබවා ඉදිරියට ඉදිරියට ඒම එහි පාලකයා බිම්බිසාර රජු වීම. ඔහු තම රාජ්‍ය අධිරාජ්‍ය තත්වයට ගෙන ඒම තෙක් අනුගමනය කළ සටන් විවාහ මත්ස්‍ය න්‍යාය ආගමික සහනශීලි ප්‍රතිපත්තිය ආදිය විස්තර කරන්න.

(iv) නාණක මූලාශ්‍ර ඉන්දියාවේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර අතර නාණක මූලාශ්‍රවලට වැදගත් තැනක් හිමිවීම.
* වෙළඳම, ආර්ථික තත්වය, ජන ජීවිතය ආක්‍රමණ, රාජධානි බිඳ වැටීම ආදී තොරතුරු රැසක් අනාවරණය කරගත හැකිවීම.
* කාසිවල සඳහන් රූප සටහන්, සංකේත සහ පාඨ ආදිය මගින් ඒවා නිකුත් කළ රජුන්, ප්‍රධානීන් වෙළඳ ශ්‍රේණි නාගරිකයන් ගැන තොරතුරු ලැබීම.
* රන්, රිදී, තඹ ලෝකඩ ආදී යොදාගත් මාධ්‍ය අනූන තත්කාලීන ආර්ථික තත්වයේ ස්වරූපය අනාවරණය වීම.
* ඉන්දියාවෙන් සොයාගත් කාසි ලෙස,
* බැක්ට්‍රියානු ග්‍රීක කාසි - රජවරු 30 දෙනෙකුපිළිබඳ තොරතුරු ලැබේ.
* දියඩෝටස්ට අයත් රන් කාසි.
* කුෂාණ කාසි - කණිෂ්ක රජුටඅයත් රන්කාසි
* ගුප්ත කාසි - මේ යුගයේ දේශපාලන, ආර්ථික, සංස්කෘතික තොරතුරු රැසක් මෙමගින් හෙළි වීම.
* සමුද්‍රගුප්ත රජුට අයත් කාසි.
* ගණ රාජ්‍යයන්ට අයති කාසි - ආදිය විස්තර කරන්න. එක් කොටසකට ලකුණු 8බැගින්)

C කොටස

06. (i) මුල්ම පාලකයා - කුජුල කැඩ්පයිසීස් - ඔහුගෙන් පසු - හීම කැඩ්පයිසීස්. (ල. 2)

(ii) මුල් බීම - චීන තුර්කිස්ථාන ප්‍රදේශය. - ගෝත්‍රය - යූ - ඒ - ච් නම් එඬේර ගෝත්‍රය (ල. 2)

(iii) ආගමික හා සංස්කෘතික වැදගත්කම.
* කුෂාණයන් විදේශීයප්‍රභාවය ලැබූ රාජවංශයක්වූවත් ඉන්දීය සංස්කෘතියට විශාල අනුග්‍රහයක් දැක්වීම.
* කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේදී සිව්වන ධර්ම සංඝායනාව පැවැත්වීම.
* මේ සංඝායනාවේ වැදගත් ප්‍රතිඵල රැසක් සිදුවීම. සූත්‍ර විභාෂ, විනය විභාෂා. අභිධර්ම විභාෂා ලෙස මහායාන ත්‍රිපිටකයක් නිර්මාණය වීම.
* මහායානබුදු දහමේ වර්ධනය. * බෝධිසත්ව සංකල්පය ප්‍රචලිත වීම.
* බෞද්ධ ප්‍රතිමා නිර්මාණය ඇරඹීම. * බෞද්ධ ගොඩනැගිලි විහාරාම හා ස්ථාන ඉදිවීම.
* සංස්කෘත භාෂාවට විශේෂ තැනක් හිමිවීම සංස්කෘත භාෂාවෙන්කෘති ලිවීම.
* මෙම යුගයේ ශ්‍රේෂ්ඨ ගත්කතුවරු බිහිවීමත අශ්වඝෝෂ නාගර්ජුන, වසුබන්ධු, පාර්ශවවැනි.
* ගාන්ධාර, මධුරා න කලා සම්ප්‍රදායයන් දියුණු වීම ආදිය විස්තරකරන්න. (ල. 4)

(iv) **<u>දේශපාලන කාර්ය :</u>**
* උත්තර ප්‍රදේශයේ සිට මාල්වා හරහා කතිවාර් තෙක් ඔහුගේ බලය ව්‍යාප්තව පැවතීම.
* පුරුෂපුරය (පෙෂාවෝර්) අගනගරය කරගෙන අධිරාජයක් පිහිටුවීම.
* මධ්‍ය ආසියානු ප්‍රදේශවල බලය ව්‍යාප්තිය.
* කණිෂ්කගේ නැගෙනහිර ඉන්දීය බලව්‍යාප්තිය ටිඉෙට් හා චීන ලේඛනවැදගත් වේ. මේ අනුව පාඨලීපුත්‍ර, බෙංගාලය, ඔරිස්සා, බිහාරිය, නේපාලය තෙක්ඔහුසිය බලය ව්‍යාප්ත කළ බව.
* පෙරිප්ලස් ඔෆ් ද එරිත්‍රියන් සී නම් ග්‍රන්ථයේ 'සන්දනෙස් නම් රජකු බටහිර ඉන්දියානු ප්‍රදේශ ජයගෙන ඇත. සන්දනෙස් ලෙස දක්වා ඇත්තේ කනිෂ්කරජු බව අනුමාන කිරීම බටහිර ඉන්දියාවේ හාරුකච්ඡ හා කතියවාරය යන ප්‍රදේශවල බලය ව්‍යාප්ත කොට ඇත.
ආදි තොරතුරු විස්තර කරන්න. (ල. 8)

07. (i) සමුද්‍රගුප්ත රජුගේ දේශපාලන කාර්ය,
* මොහු පිළිබඳව හැදෑරීමට ඇති ප්‍රධානතම ලේඛනය හිසේන කවියාගේ අලහබාද් ප්‍රශස්තියයි. මෙයට අමතර එරාන් සහ ගයා යන ස්ථානදෙකේ ප්‍රධාන සෙල්ලිපි දෙකක් පිහිටුවා ඇත.
* අලහබාද් ප්‍රශස්තියට අනුව I වන චන්ද්‍රගුප්ත රජු විසින් සිය පුත්‍ර සමුද්‍රගුප්තයන්ට රාජ්‍යභාරදීම
* සමුද්‍රගුප්ත රජුගේ බල ව්‍යාප්තියඅදියර 4ක්යටතේ සිදුවීම.
* ආර්යාවර්තය ජය ගැනීම, අටවික රාජ්‍යජය ගැනීම, දක්ෂිණාපථය ජය ගැනීම, දේශසීමාබද රාජ්‍ය ජය ගැනීම.
* සමුද්‍රගුප්ත රජු රටවනවිට ගුප්ත රාජ්‍ය ප්‍රාදේශීයබලයක් පමණක් හිමිකරගෙන සිටීම.
* පාඨලිපුත්‍රය අගනගරයකර ගනිමින් දිග් විජය ප්‍රතිපත්තියක් අනුගමනය කළ සමුද්‍රගුප්ත රජු අිසෑමය, බෙංගාලය. පංජාබය, ඩෙකැනය පසුකරමින් කාංචියතෙක් මාල්වා, කතියවාර්, දක්වාද සිය බලය ව්‍යාප්ත කළේය.
* නිශ්චිත ප්‍රවේශයක් පමණක් පාඨලීපුත්‍රයේ සිය පාලනය කරමින් සෙසු අසල්වැසි රාජ්‍යයෙන් පුද පඬුරු හා දූත ගමන් මගින් අවනතකරවා ගැනීම.
* ආර්ය්‍යාවෘත්තයේ රජවරුන් 9 දෙනෙකු යටත් කර ගැනීම.
* ප්‍රත්‍යන්ත රාජ්‍ය 9ක් යටත්කර ගැනීම. SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

* සමුද්‍රගුප්ත රජුගේ ප්‍රධාන ලේඛන 3කි. (ප්‍රයාග, ඒරණ, ගයා)
* අශ්වමේධ යාග 2ක් පැවැත්වූ බවසඳහන් වීම. රජුට සටන් සියයක වීරයා යන අභිධානය ලබාදී තිබීම.
* අධිරාජයා නිකුත් කළ විවිධ කාසි ඔහුගේ රණකාමිත්වය, දේශපාලන ආධිපත්‍යය, ආර්ථික සමෘද්ධිය විදහා දැක්වීම.
* සමුද්‍රගුප්ත ශාස්ත්‍රයෙහි මනා නිපුණයෙක් වීම. ප්‍රශස්තිකරුවා කවිරාජ යන විරුධයෙන් මොහු හැඳින්වීම. (විස්තර කරන්න) (ල. 16)

08. (i) වලභියේ මෛත්‍රිකයෝ. * නෞජයේ මෞරීවරු. * ථානේෂ්වරයේ පුෂ්‍යභූතිවරු.

(ii) * හර්ෂවර්ධන රජු අයත් රාජ වංශය - පුෂ්‍යභූති රාජවංශ්‍ය
* ඔහුගේ තොරතුරු සපයනමූලාශ්‍රය - බානභට්ටගේ හර්ෂ චරිතය, හියුංසාංගේ වාර්තා. (ල. 2)

(iii) **<u>ආගමික හා සාහිත්‍යය :</u>**
* ආගමික සහනශීලීප්‍රතිපත්තිය. * පංච වාර්ෂික මහා දානයක් පිරිනැමීම.
* කනෞජ් හා ප්‍රයාග ආගමිකකම්මේලන පැවැත්වීම.
* ස්ථූප හා විහාර ගොඩනැංවීම. * බුද්ධිමතුන්ට අනුග්‍රහ දැක්වීම.
* රාජ්‍ය ආදායමෙන් 1/4 ක් ලේඛකයන්ට පිරිනැමීම.
* නාලන්දා, තක්ෂිලා වලභිවැනිඅධ්‍යාපන මධ්‍යස්ථානවලට අනුග්‍රහ දැක්වීම.
* රජු ග්‍රන්ථකරණයේ නියැලීම. (රත්නාවලී ප්‍රියදර්ශිකා නාගානන්ද)
* රජුගේඅනුග්‍රහය නිසා විද්වතුන් විසින් සාහිත්‍යය කෘති රචනා කිරීම ආදිය විස්තර කරන්න. (ල. 4)

(iv) දේශපාලන කටයුතු :
* වලභි හා ගුර්ජර පාලකයන් සමග සටන් කිරීම.
* වාතාපියේ බටහිර දාලුක්‍යයන් සමග සටන්කිරීම.
* සින්දු ප්‍රදේශය සමග සටන් කිරීම.
* නැගෙනහිර ඉන්දියාවේ අවුද්, කොංගෝද රාජ්‍ය සමග සටන් කිරීම.
* ගුප්ත යුගයෙන් පසු උතුරු ඉන්දියාව එක්සත් කළ අවසන් පාලකයා වීම.
* කනෞජට මුල් කොටගෙනපාලනය මෙහෙයවීම.
* සංවිධානාත්මක රාජ්‍ය පරිපාලන තන්ත්‍රයක් ගොඩනැගීම.
* චීනයත් සමඟ සම්බන්ධතාපැවැත්වීම.
* සකල උත්තරාපතනාථ යන නාමයෙන් හර්ෂ රජු, සිය සතුරා වන දෙවන පුලකේශීන් සිය අයිහෝල් අභිලේඛනයේ හඳුන්වා ඇත.
* විශාල වැඩ කොටසක් කළපාලකයෙකු වූවත් මූලාශ්‍ර හිඟකම නිසා ඉතිහාසය තුළ ඔහුට නිවැරදි තක්සේරුවක් ලැබීනැත. ආදී තොරතුරු විස්තර කරන්න. (ල. 8)

09. (i) ගුප්ත යුගයේ සංස්කෘතිය - ගුප්ත යුගයේ සංස්කෘතිය තේමා කීපයක් යටතේ විග්‍රහ කළ හැකිය.
* ආගමික ප්‍රබෝධය * වාස්තු විද්‍යාව * මූර්ති කලාව හා චිත්‍ර කලාව
* අධ්‍යාපන හා සාහිත්‍යය යන අංශ යටතේ විස්තර කරන්න.

(ii) සාතවාහන යුගයේ සංස්කෘතිය :
* ඉන්දියාව දක්ෂිණාපථයේ සංස්කෘතික අභිවර්ධණයක් ඇතිකළ සුවිශේෂ රාජ වංශයක් වීම.
* ගෘහනිර්මාණ ශිල්පීය දියුණුවීම.
* පිහිටිගල ඇතුළට හාරා චෛත්‍යය ශාලා හා විහාර ගෙවල් ඉදි කිරීම.
* ඩෙකැනයේ ඇති විශිෂ්ඨ වාස්තු විද්‍යාත්මකලක්ෂණ පෙන්නුම් කරන ලෙන් කිහිපයක් ඉදිකිරීම. භාජා, බෙද්සා, කාර්ලේ, ජුන්නාර්, නාසික්, තන්හේරි, අජන්තා ලෙන්.
* බොහෝ ලෙන් බෞද්ධ භික්ෂූන්ට පූජාකිරීම. බ්‍රාහ්මණයන් හා ජෛනයන් සඳහා ද ලෙන් පූජාකිරීම.
* කාර්ලේ ලෙන විශිෂ්ඨ නිර්මාණයක් වීම.විහාර බිත්ති පවා සියුම් කැටයමින් අලංකාර කොට තිබීම. විහාරය ඇතුළට වන්නට පර්වතය හාරා කුඩා ස්ථූප නිමවා තිබීම.
* ස්ථූප ඉදිකිරී - අමරාවතී ස්ථූපයට නව අංග එකතු කිරීම. සාංචි ස්ථූපයේ වාහල්කඩ කැටයමින් නිර්මාණය කිරීම. අලුතෙන් ස්ථූප රාශියක් ඉදි කිරීම.
* මූර්ති හා චිත්‍ර කලාව - ලෙන් විහාරවල විවිධ චිත්‍ර හා මූර්ති දක්නට ලැබීමත බුද්ධ රූප චිත්‍රයට නැගීම.
අජන්තා අංක 10 ලෙන් විහාරය - නාගර්ජුනකොන්ඩ, අජන්තා ලෙන්වල ඇති චිත්‍රවල බෞද්ධකතා වස්තු හා බුද්ධ චරිතයේ ඇතැම් අවස්ථා නිරූපණය කොටතිබීම.
* මෙම චිත්‍රවල රාජකීයන් , කාන්තාවන්, තාපසයන්, කම්කරුවන්, යාචකයන්, ගොවියන් විවධ සතුන් හා වෘක්ෂලතා ආදියනිරූපණය කොට තිබීම.
* නානාහාටිහි ලෙන්වල රජ පවුලේ සාමාජිකයන්ගේ පිළිම නෙලා තිබීම.
උදා : සමුබ රජුගේ පිළිරුව, පළමුන සාතකර්ණී රජුගේ පිළිරුව, නාගනිකා දේවියගේ පිළිරුව, පළමුවන සාතකර්ණී රජුගේ පුතුන් තිදෙනාගේ පිළිරූ. ආදිය විස්තර කරන්න.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(iii) පාල රාජ වංශයේ සංස්කෘතික කටයුතු :

* ඉන්දියාවේ අවසන් බෞද්ධ අධිරාජයා වීම.
* සසංක රජුගේ ඇවෑමෙන් දුර්වල වූ බෙංගාලයේ පාල වංඹික ගෝපාල බලය පිහිටුවීම.
* ධර්මපාල රජු විසින් පාල වංශය යටතේ උතුරු ඉන්දියාවේ රාජ්‍යයක් ගොඩනැගීම.
* ධර්මපාල රජු පරමේශ්වර, පරම භට්ටාරක හා මහා රාජාඡිරාජ යන විරුදාවලින් හැඳින්වීම.
* දේවපාල රජු යටතේ තවදුරටත් අදිරාජ්‍ය ව්‍යාප්තවීම.
* පළමුවන මහීපාල, රාජේන්ද්‍ර චෝල හමුවේ පරාජයටපත්වීමත් සමගපාල රාජවංශයේ අවසානය සිදුවීම.
* මෙම පාලකයන් විසින් සංස්කෘත සේවාවන් රැසක් සිදුකිරීම.
* පාල රජවරුන් බුදු දහමට ප්‍රබල අනුග්‍රහයක් දැක්වීම.
* ගෝපාල රජු නාලන්දාවේ විහාරයක් ඉදිකිරීම.
* වික්‍රමශීලා, ඕදන්තපුරි ඇතුළු බෞද්ධ අධ්‍යාපන ආයතන 50 කට වඩි සංඛ්‍යාවක් ඉදිකිරීම.
* අටීස නම් භික්ෂුව ටිබෙටයට ධර්ම ධූත මෙහෙවරට යැවීම.
* අග්නිදිග ආසියාවේ ශ්‍රී විජය අධිරාජයා සමග බෞද්ධ සම්බන්ධතා පැවැත්වීම.
* මෙලෙස මහායාන බුදු දහමේ ප්‍රබෝදය ටිබෙටයේ සහ ගිණිකොණදිගආසියාවේ ප්‍රචලිත වීම.
* ධර්මපාල රජු නාලන්දා විහාරයට ගම්වර පූජා කිරීම.
* පාලයන්ගේ කැටයම් හා මූර්ති ශිල්පය ශ්‍රී ලංකාව, නේපාලය, තිබ්බතය, බුරුමය, ඉන්දු චීනය, හා ඉන්දුනීසියාව යනරටවල කලා ශිල්ප කෙරෙහි බලපෑම.
* සංස්කෘත සාහිත්‍යයේ දියුණුව
* බෙංගාලි භාෂාවේ සම්භවය.
* හින්දු ආගමට අනුග්‍රහ දක්වමින් දේවාලඉදි කිරීම ආදිය විස්තර කරන්න.

(iv) **<u>II චන්ද්‍රගුප්ත රජු :</u>**

* මෙතුමා පිළිබඳ හැදෑරීමට ඇති මූලාශ්‍ර :
  මථුරා ටැම් ලිපිය, උදයගිරි ගුහා ලිපිය, ගඩවා ශිලා ලිපිය, සාංචි ලේඛනය, මෙහෙරවුලි ටැම් ලිපිය.
* දේවි චන්ද්‍රගුප්ත නාට්‍යයට අනුව සමුද්‍රගුප්තගෙන් පසු රාමගුප්ත නැමැත්තෙකු රජ වූ බව. එහෙත් කාසි, සංජන තඹ තහඩුව හා අභිලේඛන මගින් දෙවන චන්ද්‍රගුප්ත නායකත්වයට පත්වී බව.
* දේවගුප්ත, වික්‍රමාදිත්‍ය, දේව ශ්‍රී, පරමභට්ටාරක යන විරුදයන් භාවිතා කිරීම හා ධ්‍රැවදේවිය හා කුවේරනාගා යන බිසෝවරු වූහ.
* මෙතුමාගේ කාලයේදී චීන දේශාටන පාහියං භික්ෂුව ඉන්දියාවට පැමිණ වසර 10ක් පමණ ඉන්දියාවේ ජීවත්වීම.
* රන්, රිදී හා තඹ කාසි නිකුත් කරමින් සිය බලය වඩාත් ඉස්මතු කිරීම.
* ගුප්ත අධිරාජ්‍ය ව්‍යාප්ත කිරීම සඳහා මෙතුමා දිග් විජය ප්‍රතිපත්ති 2ක් අනුගමනය කිරීම.
* දිග් විජය ප්‍රතිපත්ති මගින් බටහිර ඉන්දියාවේ ශක ශක්‍රප බලය බිඳ දැමීම.
* විවාහ සම්බන්ධතා මගින් අධිරාජ්‍ය විශාල කිරීම. නාග වංශික කුවේරනාගා කුමරියවිවාහ කර ගැනීම. ඇගෙන් ලැබුනු ප්‍රබාවතී ගුප්තා නම්දුවත් වාකාටක රජෙකු වූ දෙවන රුද්‍රසේනට විවාහ කරදීම.
* කදම්භ වංශික පාලක කාකුස්ථීවර්මන් රජුගේ දුවක ගුප්ත පාලකයන්ට විවාහ කරදීම. එම රජු II චන්ද්‍රගුප්ත රජු යැයි අනුමාන කෙරේ.
* මොහුගේ පාලන සමයේ කාසි නිකුත් කිරීම.
* අධ්‍යාපන හා සාහිත්‍ය කටයුතුවල විශාල දියුණුවක් ඇතිවීම. මෙතුමාගේ රාජ්‍ය සභාවේ නවරත්න නමින් කවීන් සිටි බව සඳහන් වීම. ආදිය විස්තර කරන්න.

(එක් කොටසකට ලකුණු 8 බැගින් ලකුණු 16)

SLGURU.LK
For Educational Purpose Only